# ශ්‍රී ලංකා
# ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ
# පාර්ලිමේන්තුව

---

# 1981 අංක 13 දරන
# ජාතික සෞඛ්‍ය සංවර්ධන
# අරමුදල් පනත

---

[සහතිකය සටහන් කළේ 1981 මාර්තු මස 5 වන දින]

ආණ්ඩුවේ නියමය පරිදි මුද්‍රණය කරන ලදී

---

1981 මාර්තු මස 13 වැනි දින ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රයේ II වන කොටසේ අතිරේකයක් වශයෙන් පළකරන ලදී.

ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී

කොළඹ රජයේ ප්‍රකාශන කාර්යාංශයෙන් මිළ දී ලබාගත හැක

මිළ : ශත 45 යි

තැපැල් ගාස්තුව : ශත 50 යි

# 1981 අංක 13 දරන ජාතික සෞඛ්‍ය සංවර්ධන අරමුදල් පනත

[සහතිකය සටහන් කළේ 1981 මාර්තු මස 5 වන දින]

එල්. ඩී.—ඕ. 44/80.

**"ජාතික සෞඛ්‍ය සංවර්ධන අරමුදල" යනුවෙන් හඳුන්වනු ලබන අරමුදලක් පිහිටුවීම සඳහා සහ ඒ හා සම්බන්ධ හෝ ඊට ආනුෂංගික කරුණු සඳහා විධිවිධාන සැලැස්වීම පිණිස වූ පනතකි.**

ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ පාර්ලිමේන්තුව විසින් මෙසේ පනවනු ලැබේ:—

1. මේ පනත 1981 අංක 13 දරන ජාතික සෞඛ්‍ය සංවර්ධන අරමුදල් පනත යනුවෙන් හඳුන්වනු ලැබේ. ලුහුඬු නාමය.

2. (1) (මෙහි මින් මතු "අරමුදල" යනුවෙන් සඳහන් කරනු ලබන) "ජාතික සෞඛ්‍ය සංවර්ධන අරමුදල" යනුවෙන් හඳුන්වනු ලබන අරමුදලක් පිහිටුවනු ලැබිය යුතු ය. ජාතික සෞඛ්‍ය සංවර්ධන අරමුදල පිහිටුවීම.

(2) (1) වන උපවගන්තියෙන් අරමුදලට නියම කර ඇති නාමයෙන් ඒ අරමුදල අවිච්ඡින්න පැවැත්මක් හා පොදු මුද්‍රාවක් ඇති සංස්ථාවක් විය යුතු ය; තව ද එකී නාමයෙන් අරමුදල විසින් නඩු පැවරීම ද අරමුදලට විරුද්ධව නඩු පවරනු ලැබීම ද කරනු ලැබිය හැකි ය.

3. (1) අරමුදල පිළිබඳ පරිපාලනය, කළමනාකරණය සහ පාලනය මෙහි මින් මතු විධිවිධාන සලස්වා ඇති ආකාරයට සමන්විත වන භාරකාර මණ්ඩලයක් වෙත සතු විය යුතු ය. අරමුදලෙහි භාරකාර මණ්ඩලය.

(2) (මෙහි මින් මතු "මණ්ඩලය" යනුවෙන් සඳහන් කරනු ලබන) අරමුදල පිළිබඳ භාරකාර මණ්ඩලය—

(අ) අමාත්‍යවරයාගේ අමාත්‍යාංශයේ ලේකම්වරයාගෙන්;

(ආ) සෞඛ්‍ය දෙපාර්තමේන්තුවේ සෞඛ්‍ය සේවා අධ්‍යක්ෂවරයාගෙන්;

(ඇ) ආයුර්වේද දෙපාර්තමේන්තුවේ ආයුර්වේද කොමසාරිස්වරයාගෙන්;

(ඈ) අමාත්‍යවරයාගේ අමාත්‍යාංශයේ ප්‍රධාන ගණකාධිකාරිවරයාගෙන්; සහ

(ඉ) අමාත්‍යවරයා විසින් පත් කරනු ලබන්නා වූ ද, අමාත්‍යවරයා විසින් එක් එක් තැනැත්තා වෙත නිකුත් කරන ලද පත් වීම් ලිපියෙහි සඳහන් කරනු ලබන කාලයක් සඳහා ඒ එක් එක් තැනැත්තා විසින් (4) වන, (5) වන සහ (6) වන උපවගන්තිවල විධිවිධානවලට යටත්ව ධූරය දැරිය යුතු වූ ද, වෙනත් සාමාජිකයන් තිදෙනකුගෙන්

සමන්විත විය යුතු ය. අමාත්‍යවරයා විසින් පත් කරන ලද සාමාජිකයකු "පත් කරන ලද සාමාජිකයකු" වශයෙන් මේ පනතෙහි සඳහන් කරනු ලැබේ.

(3) අමාත්‍යවරයාගේ අමාත්‍යාංශයේ ලේකම්වරයා මණ්ඩලයේ (මෙහි මින් මතු "සභාපතිවරයා" යනුවෙන් සඳහන් කරනු ලබන) සභාපතිවරයා විය යුතු ය.

ඒ—53823—11,600 (80/12)

(4) අමාත්‍යවරයා විසින්, සුදුසු යයි තමා කල්පනා කරනු ලබන්නේ නම්, කවර හෝ හේතුවක් නොදක්වා, මණ්ඩලයේ යම් පත් කරන ලද සාමාජිකයකු ධුරයෙන් ඉවත් කළ හැකි ය.

(5) (4) වන උපවගන්තියේ විධිවිධාන යටතේ ධුරයෙන් ඉවත් කරනු ලැබූ මණ්ඩලයේ සාමාජිකයකු, මණ්ඩලයේ සාමාජිකයකු වශයෙන් නැවත පත් කරනු ලැබීමට හෝ වෙනත් යම් තත්ත්වයකින් මණ්ඩලයේ සේවය කිරීමට හෝ සුදුසු නොවිය යුතු ය.

(6) මණ්ඩලයේ පත් කරන ලද සාමාජිකයකුට, අමාත්‍යවරයා වෙත යොමු කරන ලද ලිඛිත දැනුම් දීමක් මගින්, ඕනෑම අවස්ථාවක දී තම ධුරයෙන් අස්විය හැකි ය.

(7) මණ්ඩලයේ සභාපතිවරයාට හෝ යම් සාමාජිකයකුට, අසනීප වීම නිසා හෝ ශ්‍රී ලංකාවෙන් බැහැරව සිටීම නිසා හෝ වෙනත් යම් හේතුවක් නිසා තාවකාලිකව තම ධුරයේ කාර්ය ඉටු කිරීමට නොහැකි වුවහොත්, අමාත්‍යවරයා විසින් ඔහු වෙනුවට කටයුතු කිරීමට වෙනත් තැනැත්තකු පත් කළ හැකි ය.

(8) මණ්ඩලයේ පත් කරන ලද සාමාජිකයකු තම ධුර කාලය අවසන් වීමට පෙර, මරණය, ඉල්ලා අස්වීම හෝ ඉවත් කිරීම නිසා, තම ධුරය අතහැර ගියහොත්, ඔහුගේ අනුප්‍රාප්තිකයා විසින් ඒ අනුප්‍රාප්තිකයා තම ධුරය කලින් අතහැර යන්නේ නම් මිස, තමා අනුප්‍රාප්ත වන තැනැත්තාගේ ධුර කාලයෙන් නොගෙවී ඇති කොටස සඳහා ධුරය දැරිය යුතු ය.

(9) මණ්ඩලයේ සාමාජිකයන් අතර යම් පුරප්පාඩුවක් තිබීමේ හෝ එහි සාමාජිකයකු පත් කිරීමෙහි ලා යම් දෝෂයක් තිබීමේ හෝ හේතුව නිසා ම පමණක් මණ්ඩලයේ කිසිම ක්‍රියාවක් හෝ කටයුත්තක් අවලංගු වෙතැයි සලකනු නොලැබිය යුතු ය.

(10) මණ්ඩලයේ රැස්වීම් පිළිබඳ කාර්ය පටිපාටිය ද ඒ රැස්වීම්වල කටයුතු ද විධිමත් කිරීම සඳහා මණ්ඩලය විසින් රීති සාදනු ලැබිය හැකි ය.

**මණ්ඩලයේ පත් කරන ලද සාමාජිකයන්ගේ පාරිශ්‍රමිකය.**

4. අමාත්‍යවරයා විසින් නිරණය කරනු ලබන ආකාරයට සහ අනුප්‍රමාණ අනුව මණ්ඩලයේ පත් කරන ලද සාමාජිකයකුට පාරිශ්‍රමික ගෙවිය යුතු ය.

**මණ්ඩලයේ බලතල.**

5. මණ්ඩලයට, අරමුදලෙහි නාමයෙන්—

(අ) චංචල හෝ නිශ්චල දේපළ අත්කර ගැනීමේ, දැරීමේ හෝ කළමනාකරණය කිරීමේ;

(ආ) අරමුදලට හිමිකම ලැබෙන යම් චංචල හෝ නිශ්චල දේපළක් විකිණීමේ, උකස් කිරීමේ, හුවමාරු කිරීමේ හෝ අන්‍යාකාරයකින් බැහැර කිරීමේ නැතහොත් ඒ දේපළ සම්බන්ධයෙන් කටයුතු කිරීමේ;

(ඇ) මේ පනතේ විධිවිධාන බලගැන්වීම පිණිස අවශ්‍ය සියලු ක්‍රියා හෝ දේ ඉටු කිරීමේ

බලය තිබිය යුතු ය.

අරමුදලට ගෙවීම.

6. 7 වන වගන්තියේ දක්වා ඇති කාර්යවලින් කිසිවක් සඳහා, ශ්‍රී ලංකාවේ හෝ විදේශවල පුද්ගලයන්ගෙන්, ව්‍යාපාරික ආයතන වලින් හා ආයතනවලින් තෑගි හෝ පරිත්‍යාග වශයෙන් ලැබෙන සියලු මුදල් අරමුදලේ ගිණුමට බැර කරනු ලැබිය යුතු ය.

අරමුදලේ මුදල් යොදවනු ලැබිය හැකි කාර්ය.

7. අරමුදලට අයත් මුදල්, අමාත්‍යවරයාගේ විධානවලට යටත්ව, පහත දක්වෙන කාර්යවලින් කිසිවක් සඳහා යොදා ගැනීම මණ්ඩලයේ කාර්යය විය යුතු ය :—

(අ) ශ්‍රී ලංකාවේ සෞඛ්‍යාරක්ෂක සේවා සපයන ආයතන සංවර්ධනය කිරීම හා ප්‍රවර්ධනය කිරීම ;

(ආ) ශ්‍රී ලංකාවේ සෞඛ්‍යාරක්ෂක සේවාවල නිරතව සිටින තැනැත්තන් අතර පර්යේෂණ කටයුතු ප්‍රවර්ධනය කිරීම සහ ඒ හා සම්බන්ධ තැනැත්තන්ගේ අධ්‍යාපනය හෝ ඥානය වර්ධනය කිරීම ;

(ඇ) විශේෂ යෝජනා ක්‍රමයක් සම්බන්ධයෙන් මුදල් යෙදවීමේ කාර්යය සඳහා යම් පරිත්‍යාගයක් ලැබී ඇති අවස්ථාවක දී ඒ පරිත්‍යාගය, හැකිතාක් දුරට, එම විශේෂ යෝජනා ක්‍රමයට මුදල් යෙදවීම සඳහා උපයෝගී කර ගැනීමට වග බලා ගනිමින් ශ්‍රී ලංකා ජනතාව අතර රෝග වැළැක්වීම සඳහා අවශ්‍ය පියවර ගැනීමේ හෝ ඔවුන්ගේ සෞඛ්‍ය ආරක්ෂා කිරීමේ කාර්යය සඳහා වූ යම් යෝජනා ක්‍රමයකට මුදල් යෙදවීම ;

(ඈ) ශ්‍රී ලංකාවේ සෞඛ්‍යාරක්ෂක සේවා පිළිබඳ කාර්ය සඳහා පාවිච්චි කරනු ලබන වෛද්‍ය උපකරණ සහ අත්‍යාවශ්‍ය ඖෂධ මිලට ගැනීම.

අරමුදලේ මුදල් ආයෝජනය කිරීම.

8. අරමුදලට අයත් යම් මුදලක්, අමාත්‍යවරයා විසින් දෙනු ලබන විධානවලට යටත්ව, මණ්ඩලය විසින් නිශ්චය කරනු ලබන ආකාරයට මණ්ඩලය විසින් ආයෝජනය කරනු ලැබිය හැකි ය.

අරමුදලෙහි නිලධරයෝ සහ සේවකයෝ.

9. අමාත්‍යවරයාගේ විධානවලට යටත්ව, මණ්ඩලයට—

(අ) අරමුදලේ කටයුතු පරිපාලනය කිරීම හා කළමනාකරණය කිරීම සඳහා අවශ්‍ය වනු ලබන අරමුදලේ නිලධරයන් සහ සේවකයන් පත් කිරීමට ;

(ආ) එසේ පත් කරන ලද නිලධරයන්ට හා සේවකයන්ට ගෙවිය යුතු පාරිශ්‍රමික නිශ්චය කිරීමට ;

(ඇ) ඒ පාරිශ්‍රමික සහ අරමුදලේ කටයුතු පරිපාලනය කිරීමෙහි ලා දරන ලද වෙනත් වියදම් අරමුදලේ ආදායමෙන් ගෙවීමට

බලය තිබිය යුතු ය.

ගිණුම් සහ විගණනය.

10. (1) අරමුදලේ ආදායම සහ වියදම පිළිබඳව නිසි ගණන් පොත් තැබීමට මණ්ඩලය විසින් සැලැස්විය යුතු ය.

(2) විගණකාධිපතිවරයා විසින් සෑම වර්ෂයක දී ම අරමුදලේ ගිණුම් විගණනය කරනු ලැබිය යුතු ය. ඒ ගිණුම් විගණනය කිරීමේ දී තමාට සහාය වීමේ කාර්යය සඳහා විගණකාධිපතිවරයා විසින් යම්

සුදුසුකම් ලත් විගණකවරයකුගේ සේවය ලබා ගනු ලැබිය හැකි අතර, ඒ විගණකවරයා විසින් විගණකාධිපතිවරයාගේ විධානය සහ පාලනය යටතේ ක්‍රියා කළ යුතු ය.

(3) අරමුදලේ ගිණුම් විගණනය කිරීමෙහි ලා විගණකාධිපතිවරයා විසින් දරන ලද වියදම් පියවීමේ කාර්යය සඳහා, මණ්ඩලය විසින් නිශ්චය කරනු ලබන පාරිශ්‍රමිකයක් අරමුදලේ ආදායමෙන් විගණකාධිපතිවරයාට ගෙවනු ලැබිය යුතු ය. විගණකාධිපතිවරයාට අරමුදලින් ලැබෙන යම් පාරිශ්‍රමිකයකින්, ඒ විගණනයේ කාර්යය සඳහා ඔහු විසින් සේවයෙහි නියුක්ත කර ගන්නා ලද යම් සුදුසුකම් ලත් විගණකවරයකුට හෝ විගණකවරයන්ට ඔහු විසින් ගෙවන ලද යම් මුදලක් අඩුකර ගැනීමෙන් පසුව, ඒ පාරිශ්‍රමිකයේ ශේෂය ඒකාබද්ධ අරමුදලට බැර කරනු ලැබිය යුතු ය.

(4) එක් එක් වර්ෂයේ දෙසැම්බර් මස තිස් එක් වන දිනට පසු හැකිතාක් ඉක්මණින් විගණකාධිපතිවරයා විසින් ඒ වර්ෂය තුළ අරමුදලේ ආදායම හා වියදම පිළිබඳ සහ අරමුදලට අයත් මුදල් ආයෝජනය කිරීම පිළිබඳ ප්‍රකාශයක් ද සමග ඒ වර්ෂය තුළ අරමුදලේ කටයුතු පරිපාලනය කිරීම පිළිබඳ වාර්තාවක් පිළියෙල කරනු ලැබිය යුතු ය.

(5) මේ වගන්තියෙහි "සුදුසුකම් ලත් විගණකවරයා" යන්නෙන්—

(අ) ශ්‍රී ලංකාවේ වරලත් ගණකාධිකාරීන්ගේ ආයතනයේ හෝ නීතියෙන් පිහිටුවන ලද වෙනත් යම් ආයතනයක හෝ සාමාජිකයකු වූ ද ගණකාධිකාරිවරයකු වශයෙන් වෘත්තියෙහි යෙදීමට ඒ ආයතනයේ සභාව විසින් නිකුත් කරන ලද සහතිකයක් දරන්නා වූ ද තැනැත්තෙක් ; හෝ

(ආ) යම් ගණකාධිකාරී සමාගමක එක් එක් නේවාසික හවුල්කරු ශ්‍රී ලංකා වරලත් ගණකාධිකාරීන්ගේ ආයතනයේ හෝ නීතියෙන් පිහිටුවන ලද වෙනත් යම් ආයතනයක හෝ සාමාජිකයකුව සිටින්නේ ද එමෙන් ම ගණකාධිකාරිවරයකු වශයෙන් වෘත්තියෙහි යෙදීමට එකී ආයතනයේ සභාව විසින් නිකුත් කරන ලද සහතිකයක් දරන්නේ ද එවැනි වරලත් ගණකාධිකාරී සමාගමක් ; හෝ

අදහස් වේ.

විගණකාධිපතිවරයාගේ වාර්තාව සහ ප්‍රකාශය පාර්ලිමේන්තුව වෙත ඉදිරිපත් කළ යුතු බව.

11. විගණකාධිපතිවරයා විසින් 10 වන වගන්තියේ (4) වන උපවගන්තියේ විධිවිධාන අනුව පිළියෙල කරනු ලබන වාර්තාව සහ ප්‍රකාශය ඔහු විසින් අමාත්‍යවරයා වෙත යැවිය යුතු අතර, ඒ අමාත්‍යවරයා විසින් ඒ වාර්තාව සහ ප්‍රකාශය පාර්ලිමේන්තුව වෙත ඉදිරිපත් කරනු ලැබීමට සැලැස්විය යුතු ය.

මුදල් වර්ෂය.

12. ජනවාරි මස පළමුවන දින ආරම්භ වන සහ දෙසැම්බර් මස තිස් එක් වන දින අවසන් වන වර්ෂය අරමුදලේ කාර්යය සඳහා මුදල් වර්ෂය වන්නේ ය.

ඇතැම් තීරුබදු වලින් හා බදු වලින් අරමුදල නිදහස් කිරීම.

**13.** (1) යම් භාණ්ඩ ආනයනය කිරීම අරමුදලේ කාර්ය ඉටුවීම සඳහා හිතකර යයි සලකනු ලැබේ නම් අමාත්‍යවරයා විසින්, මුදල් විෂයය භාර අමාත්‍යවරයාගේ එකඟත්වය ඇතිව, අරමුදල විසින් ආනයනය කරනු ලබන ඒ භාණ්ඩ වෙනුවෙන් යම් තීරු බද්දක් ගෙවිය යුතුවීමෙන් අරමුදල නිදහස් කරනු ලැබිය හැකි ය.

(2) 1979 අංක 28 දරන දේශීය ආදායම් පනත යටතේ ගෙවිය යුතු යම් ආදායම් බද්දකින් හෝ ධන බද්දකින් අරමුදල නිදහස් විය යුතු ය.

(3) යම් තැනැත්තකු අරමුදලට තෑග්ගක් පිරිනමන අවස්ථාවක එම තෑග්ගේ මුළු වටිනාකමේ ප්‍රමාණයට, 1979 අංක 28 දරන දේශීය ආදායම් පනත යටතේ ඇති තෑගි බද්ද ගෙවිය යුතු වීමෙන් ඒ තැනැත්තා නිදහස් විය යුතු ය.

(4) යම් තැනැත්තකු අරමුදලට පරිත්‍යාගයක් කරන අවස්ථාවක, 1979 අංක 28 දරන දේශීය ආදායම් පනතේ කාර්ය සඳහා ඒ පරිත්‍යාගය අනුමත වියදමක් ලෙස සලකනු ලැබිය යුතු අතර ඒ පරිත්‍යාගයේ මුළු වටිනාකම වෙනුවෙන් ඒ පනත යටතේ සහනය ලැබීමට ත්‍යාගදායකයා හිමිකම් ලැබිය යුතු ය.

(5) 1979 අංක 28 දරන දේශීය ආදායම් පනතෙහි පටහැනිව කුමක් සඳහන්ව ඇත ද මේ වගන්තියේ විධිවිධාන බලපැවැත්විය යුතු ය.

අරමුදලේ නිලධරයන් හා සේවකයන් දණ්ඩ නීති සංග්‍රහයේ අර්ථානුකූලව රජයේ සේවකයන් ලෙස සලකනු ලැබිය යුතු බව.

**14.** අරමුදලේ සියලු නිලධරයන් හා සේවකයන් දණ්ඩ නීති සංග්‍රහයේ අර්ථානුකූලව සහ එහි කාර්ය සඳහා රජයේ සේවකයන් ලෙස සලකනු ලැබිය යුතු ය.

අල්ලස් පනතේ අර්ථානුකූලව අරමුදල උපලේඛනගත ආයතනයක් විය යුතු බව.

**15.** අල්ලස් පනතේ අර්ථානුකූලව අරමුදල උපලේඛනගත ආයතනයක් ලෙස සලකනු ලැබිය යුතු අතර එම පනතේ විධිවිධාන ඒ අනුව අදාළ විය යුතු ය.

පාර්ලිමේන්තුවේ පනත් කෙටුම්පත්වල සහ නීතිවල වාර්ෂික දායක මිල (දේශීය) රු. 30 කි. (විදේශීය) රු. 40 කි. කොළඹ 1, තැ. පෙ. අංක 500, රජයේ ප්‍රකාශන කාර්යාංශයේ අධිකාරි වෙත සෑම වර්ෂයකම දෙසැම්බර් මස 15 වැනි දිනට පෙර දායක මුදල් ගෙවා පසුව එළඹෙන එක් එක් වර්ෂය සඳහා ඒවා ලබාගත හැකිය. මුදල් ගෙවූ දිනට කලින් නිකුත් කරන ලද පනත් කෙටුම්පත් සහ නීති නොසැපයීමේ කොන්දේසිය මත ප්‍රමාද දායක මුදල් භාරගනු ලැබේ.